# අ.පො.ස උසස් පෙළ



# ගිණුම්කරණය




## ඒකකය 02

ව්‍යාපාරයක ගණුදෙණු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි

වයාපාරයක ගණුදෙණු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි.

## 2.1.1. ව්‍යාපාර ඒකක සංකල්පය

◆ ව්‍යාපාර ඒකක සංකල්පය පැහැදිලි කරන්න

✓ පිළිතුර

ගිණුම්කරණයේ මූලික පදනම ලෙස ව්‍යාපාරය එහි අයිතිකරුගෙන් වෙන් වූ ස්වාධීන ඒකකයක් ලෙස සලකනු ලැබේ.





Copyright © e-thaksalawa.moe.gov.lk

## 2.1.2. ව්‍යාපාරික ගනුදෙනු

- ව්‍යාපාරයක සිදුවීමට ඉඩ ඇතැයි සැළකිය හැකි ගනුදෙනු 05 ක් ලියන්න.

✓ පිළිතුර

- 2017/04/01 දින කළණ රු:200000ක් යොදා ව්‍යාපාරය කළේය.
- 2017/04/02 දින රු:30000ක් ගෙවා ලී බඩු හා කාර්යාල උපකරණ මිලට ගැනීම.
- 2017/04/04 දින රු:40000ක බඩු තොගයක් ලෝචනගෙන් ණයට ගැනීම.
- 2017/04/08 දින රු:10000ක බැංකු ණයක් ලබා ගැනීම.
- 2017/04/10 දින රු:20000ක පිරිවැය වූ තොගයක් සේනානිට ණයට විකිණීම.

## 2.1.3. මූල්‍ය මිනුම්

- මූල්‍ය මිනුම් සංකල්පය පැහැදිලි කරන්න.

✓ පිළිතුර

- ගිණුම්කරණයේදී මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධීන් පමණක් හඳුනාගෙන වාර්තා කිරීම.
- විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක නිරත "ටයිටන්" ව්‍යාපාරික කටයුතු සඳහා යොදවන ලද සම්පත් පහත දැක්වේ.
  - ගොඩනැගිල්ල
  - මෝටර් රථය
  - අළුත්වැඩියා කිරීමේ ද්‍රව්‍ය
  - ව්‍යාපාර ස්ථානය ආකර්ෂණීය පරිසරයක පිහිටීම
  - කළමනාකරණ දක්ෂතා
  - ටයිටන් සතු තාක්ෂණික දැනුම

- ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු මුදලින් මැනිය හැකි සම්පත් සහ මුදලින් මැනිය නොහැකි සම්පත් ලෙස වර්ග කරන්න.

✓ පිළිතුරු

| මුදලින් මැනිය හැකි සම්පත් | මුදලින් මැනිය නොහැකි සම්පත් |
|---|---|
| ගොඩනැගිල්ල | ව්‍යාපාර ස්ථානය ආකර්ෂණීය පරිසරයක පිහිටීම |
| මෝටර් රථය | කළමනාකරණ දක්ෂතා |
| අළුත්වැඩියා කිරීමේ ද්‍රව්‍ය | ටයිටන් සතු තාක්ෂණික දැනුම |


Copyright © e-thaksalawa.moe.gov.lk

## 2.1.4.ගිණුම්කරණ සමීකරණය හා එහි මූලිකාංග

◆ ගිණුම්කරණ සමීකරණය යන්න පැහැදිලි කරන්න.

✓ පිළිතුර

- ව්‍යාපාරයක වත්කම්, හිමිකම් හා වගකීම් අතර පවතින ශ්‍රිතමය සම්බන්ධතාවය ගණිතමය ආකාරයට ඉදිරිපත් කිරීම.

◆ මූලික ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

✓ පිළිතුර

| |
|---|
| වත්කම් = හිමිකම් + වගකීම් |
| A = C + L |

◆ ගිණුම්කරණ සමීකරණයේ මූලිකාංග දක්වා පැහැදිලි කරන්න.

✓ පිළිතුර

**වත්කම්**

- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහිවී ඇති
- ව්‍යාපාරය විසින් පාලනය කරන
- අනාගතයේ ව්‍යාපාරය තුලට ආර්ථික ප්‍රතිලාභ ගලාඑන සම්පත් වත්කම් වේ.

උදා: ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, යන්ත්‍ර සූත්‍ර, බඩු තොගය, ණය ගැතියෝ, මුදල් හා බැංකු ශේෂය.











The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**හිමිකම්-**

ව්‍යාපාරයක වත්කම් සම්බන්ධයෙන් අයිතිකරුට ඇති අයිතිය.

උදා:

- අයිතිකරු ව්‍යාපාරයට යොදවා ඇති මුදල් හා අනෙකුත් වත්කම්

**වගකීම්-**

- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් මත බිහිවී ඇත.
- බේරුම් කිරීමේදී ආර්ථික ප්‍රතිඵල සහිත සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යන
- වර්තමාන බැදීම්

**වගකීම්** වේ.

උදා: බැංකු ණය,වෙළඳ හිමියෝ-ගෙවිය යුතු වියදම්,බැංකු අයිරාව

## 2.1.5.ව්‍යාපාරික ගනුදෙනු වත්කම්, හිමිකම් හා වගකීම් වලට සිදුකරන බලපෑම

- <u>අයිතිකරු පමණක් වත්කම් යොදවා ඇති විට</u>

  - කවීෂ 2017.05.01 ජංගම දුරකථන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කලේය.ඔහු සතු රු.800000ක් වටිනා ගොඩනැගිල්ලද මුදලින් රු.200000ක්ද රු.50000ක් වටිනා කාර්යාල උපකරණද ව්‍යාපාරය සඳහා යෙදවීම.

- ඉහත ගනුදෙනු වත්කම් = හිමිකම් යන සමීකරණ ඇති කරන බලපෑම වෙන වෙනම දක්වන්න.

✓ පිළිතුර

A1:

| | වත්කම් | = | හිමිකම් |
|---|---|---|---|
| ◆ ගොඩනැගිල්ල යෙදවීම | +800000 | = | 800000(ප්‍රාග්ධනය) |
| ◆ මුදල් යෙදවීම | +200000 | = | 200000(ප්‍රාග්ධනය) |
| ◆ ලී බඩු උපකරණ යෙදවීම | + 50000 | = | 50000 (ප්‍රාග්ධනය) |
| | 1050000 | = | 1050000 |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

➢ ඉහත කවීෂගේ ව්‍යාපාරය, ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා 2017/05/10 වන දින රු:100000ක ණය මුදලක් මහජන බැංකුවෙන් ලබා ගනී.

◆ ඉහත ගනුදෙනුව සිදුවීමෙන් පසු එහි බලපෑම ගිණුම්කරණ සමීකරණය මගින් දක්වන්න.

✓ පිළිතුර

A2:

| | වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 05/01 ශේෂය | 1050000 | = | 1050000 | + | -------------- |
| 05/10බැංකු ණය ගැනීම | 100000 | = | -------------- | + | 100000 |
| | 1150000 | = | 1050000 | + | 100000 |

## 2.2.1. හිමිකම් වෙනස්වීමට බලපාන සාධක

◆ හිමිකම වෙනස්වීමට බලපාන සාධක නම් කර පැහැදිලි කරන්න

✓ පිළිතුර

- **ගැනිලි (drawings)**

ව්‍යාපාරයක අයිතිකරුවන් විසින් පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපාරයෙන් ඉවත් කර ගන්නා භාණ්ඩ හෝ මුදල්

උදා : මුදල් ගැනිලි රු.5000

භාණ්ඩ ගැනිලි රු. 10000

- **වියදම (Expenditures)**

ව්‍යාපාරයක ගැනිලි වලින් තොරව හිමිකම අඩුවීමට ඉවහල් වන ගණුදෙනු හා සංසිද්ධි

උදා : ව්‍යාපාරයේ විදුලි බිල රු. 2000

සේවක වේතන ගෙව්වා රු. 12000

බොල් ණය රු.3000


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

මෝටර් රථ ක්ෂය රු.8000

දුන් වට්ටම් රු.1000

- **අමතර ප්‍රාග්ධනය (Additional Capital)**

දැනට පවත්වාගන යන ව්‍යාපාරයකට අයිතිකරුවන් විසින් යොදවනු ලබන වත්කම්

උදා : අයිතිකරු රු.50000 ක් නැවත ව්‍යාපාරයට යෙදවීම

- **ආදායම (Income)**

අමතර ප්‍රාග්ධනය යෙදවීමකින් තොරව හිමිකම වැඩිවීමට ඉවහල් වන ගණුදෙනු හා සිද්ධි

උදා : රු. 20000 ක් පිරිවැය වූ තොග රු.30000 කට මුදලට විකිණීම

ව්‍යාපාර ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දීමෙන් ලද මුදල රු.15000 කි.

ලද වට්ටම් රු.20000

ලද කොමිස් රු.1000 කි

## 2.2.2. ශුද්ධ වත්කම ඇසුරින් ලාභය / අලාභය ගණනය කිරීම

අමන්දා විසින් පවත්වා ගන යන " කිටී " වෙළඳ සැලේ 2017.05.01 දිනට වත්කම් සහ වගකීම් පහත දැක්වේ.

| අයිතමය | 2017/05/01 | 2017/05/31 |
|---|---|---|
| | රු.000 | රු.000 |
| ඉඩම් සහ ගොඩනැගිලි | 5000 | 7000 |
| මෝටර් රථ | 2000 | 1800 |
| යන්ත්‍ර | 1000 | 900 |
| බඩු තොගය | 500 | 600 |
| වෙළඳ ණය ගැතියෝ | 1500 | 2000 |
| මුදල් | 200 | 300 |
| බැංකු ණය | 2000 | 1500 |
| වෙළඳ ණය හිමියෝ | 700 | 800 |
| ගෙවිය යුතු වියදම් | 300 | 200 |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

අතිරේක තොරතුරු

අමන්දා මාසය තුළ රු.1000000 ක් වටිනා සිය පෞද්ගලික ගොඩනැගිල්ලක් ව්‍යාපාර කටයුතු සඳහා යොදවා ඇත.

- ඇයගේ පෞද්ගලික පුස්තකාලය සඳහා ව්‍යාපාරයෙන් රු.100000 ක පොත් මාසය තුළ රැගෙන ගොස් ඇත.2017/05/01 දිනට හා 2017/05/31 දිනට ශුද්ධ වත්කම් (හිමිකම) ගණනය කරන්න

✓ පිළිතුර

| | 2017/05/01 | 2017/05/31 |
|---|---|---|
| වත්කම් | රු.000 | රු.000 |
| ඉඩම් සහ ගොඩනැගිලි | 5000 | 7000 |
| මෝටර් රථ | 2000 | 1800 |
| යන්ත්‍ර | 1000 | 900 |
| බඩු තොගය | 500 | 600 |
| වෙළඳ ණය ගැතියෝ | 1500 | 2000 |
| මුදල් | 200 | 300 |
| මුළු වත්කම් | 10200 | 12600 |
| | | |
| වගකීම් | | |
| බැංකු ණය | 2000 | 1500 |
| වෙළඳ ණය හිමියෝ | 700 | 800 |
| ගෙවිය යුතු වියදම් | 300 | 200 |
| මුළු වගකීම් | (3000) | (2500) |
| | | |
| ශුද්ධ වත්කම | 7200 | 10100 |
| | | |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

◆ ඉහත අමන්දා පවත්වා ගන යන "කිටී " වෙළඳසැලේ අතිරේක තොරතුරු ප්‍රයෝජනයට නොගෙන පහත සමීකරණය භාවිතයෙන් 2017 මැයි මාසය සඳහා ශුද්ධ ලාභය / අලාභය ගණනය කරන්න

✓ පිළිතුර

ශුද්ධ ලාභය / අලාභය = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්ක්ම්

$P / L = NA_1 - NA_0$

$= 10100 - 7200$

ශුද්ධ ලාභය = 2900

◆ ඉහත අමන්දා පවත්වා ගන යන "කිටී " වෙළඳසැලේ අතිරේක තොරතුරු ප්‍රයෝජනයට ගෙන පහත සමීකරණය භාවිතයෙන් 2017 මැයි මාසය සඳහා ශුද්ධ ලාභය / අලාභය ගණනය කරන්න

✓ පිළිතුර

ශුද්ධ ලාභය / අලාභය =අවසාන ශුද්ධ වත්කම්-ආරම්භක ශුද්ධ වත්ක්ම් +ගැනිලි -අතිරේක ප්‍රාග්ධනය

$P / L = NA_1 - NA_0 + D - AC$

$P / L = 10100 - 7200 + 100 - 1000$

ලාභය( P ) = 2000


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 2.3.1. ගැලපුම් සංකල්පය

◆ ගැලපුම් සංකල්පය යන්න පැහැදිලි කරන්න

✓ පිළිතුර

ගිණුම් කාල පරිච්ඡේදයකට අදාළව මූල්‍ය ප්‍රතිඵලය ( ලාභය / අලාභය ) නිශ්චය කිරිමේ එම ගිණුම් කාලපරිච්ඡේදයේ හඳුනාගත් ආදායම ඉපයීමට අදාල සියළු වියදම් ආදායමට එරෙහිව ගැලපිය යුතුවේ.

උදා : රු. 20000 ක පිරිවැය වූ තොගයක් රු.30000 කට විකිණීමේදී රු.30000ක ආදායම ඉපයීමට අදාළ සියළු වියදම් ( විකුණුම් පිරිවැය ) රු. 20000 ඉපයූ රු.30000 ක ආදායමින් අඩු කළ යුතුය.

ලාභය = විකුණුම් ආදායම - විකුණුම් පිරිවැය

= 30000 - 20000

= 10000

## 2.3.2. ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හැඳින්වීම

◆ ලාභ හෝ අලාභ ප්‍රකාශනය යනු කුමක්ද?

✓ පිළිතුර

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය යනු ව්‍යාපාරයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයක මූල්‍ය ප්‍රතිඵලය (ලාභය / අලාභය ) ගණනය කිරීම සඳහා පිළියෙල කරන ප්‍රකාශනයයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

◆ වෙළඳ ව්‍යාපාරයක ලාභ හෝ අලාභ ප්‍රකාශනයක ආකෘතිය දක්වන්න

✓ පිළිතුර

........................... ව්‍යාපාරය

............................. දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| විකුණුම් | | | xxx |
| විකුණුම් පිරිවැය | | | (xx) |
| | | | |
| දළ ලාභය | | | xx |
| | | | |
| වෙනත් ආදායම් | | | |
| ලද වට්ටම් | x | | |
| ලද කොමිස් | x | | xx |
| | | | xxx |
| වියදම් | | | |
| | | | |
| විදුලි වියදම් | x | | |
| සේවක වේතන | X | | |
| දුන් වට්ටම් | X | | |
| බොල් ණය | X | | |
| ක්ෂය | x | | (xx) |
| | | | |
| ශුද්ධ ලාභය | | | xx |


Copyright © e-thaksalawa.moe.gov.lk

◆ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනු කුමක්ද?

✓ පිළිතුර

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනුව්‍යාපාරයක ගිණුම් කාලපරිච්ඡේදයක් අවසාන වන දිනට මූල්‍ය තත්ත්වය නිරූපනය කිරීම සඳහා පිලියෙල කරනු ලබන ප්‍රකාශනයයි.

◆ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක ආකෘතිය දක්වන්න.

✓ පිළිතුර

…………………… ව්‍යාපාරය
…………………….. දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | |
|---|---|---|
| වත්කම් | (රු) | (රු) |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | xxx |
| මෝටර් රථ | | xxx |
| යන්ත්‍ර | | xxx |
| ජංගම වත්කම | | |
| ඉතිරි තොගය | | xxx |
| වෙළඳ ණයගැතියෝ | | xxx |
| මුදල් | | xxx |
| මුළු වත්කම් | | |
| | | xxx |
| | | |
| හිමිකම් හා වගකීම් | | |
| හිමිකම් | | |
| ප්‍රාග්ධනය | xxx | |
| ශුද්ධ ලාභය | xxx | |
| ගැනිලි | (xx) | |
| | | xxx |
| ජංගම නොවන වගකීම් | | |
| බැංකු ණය | xx | |
| ජංගම වගකීම් | xx | |
| වෙළඳ ණය හිමියෝ | xx | |
| ගෙවිය යුතු වියදම් | xx | xxx |
| මුළු හිමිකම් හා වගකීම් | | xxx |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

### 2.3.3. ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කිරීම.

කාන්තිගේ ව්‍යාපාරයේ 2017 ජූලි මාසය තුලදී පහත ගනුදෙනු සිදුවිය.

- 7/1 තමා ඉතිරිකරගත් රු:250000 ක මුදල යොදවා සිල්ලර වෙළඳ සැළක් ආරම්භ කිරීම.
- 7/2 ව්‍යාපාරයේ විකිණීම සඳහා රු: 50000ක් ගෙවා බඩු තොග මිලට ගත්තා.
- 7/5 පිරිවැය (ගත්මිල) රු: 15000ක බඩු තොගයක් රු:25000කට අත්පිට මුදලට වික්කා.
- 7/10 සේනානිගෙන් ණයට බඩු තොග මිලදී ගත්තා රු:30000..
- 7/12 සේවක වැටුප් ගෙව්වා රු:3000 යි.
- 7/15 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු:200000ක් වටිනා මෝටර් රථයක් ටයිටන් සමාගමෙන් ණයට ගත්තා.
- 7/18 කාන්තිගේ ජීවිත රක්ෂණ ඔප්පු වාරිකය සඳහා රු:5000ක් ව්‍යාපාරයෙන් ගෙව්වා.
- 7/20 ණයහිමි සේනානිට රු:15000ක් ණය පියවීමේදී ලද වට්ටම රු:1500 යි.
- 7/24 පිරිවැය රු:15000ක බඩුතොග රු:20000කට වානකට ණයට වික්කා
- 7/25 ව්‍යාපාරය පුළුල් කිරීමට රු100000ක බැංකු ණය මුදලක් මහජන බැංකුවෙන් ලබාගත්තා.
- 7/28 ණයගැති වානකගෙන් ලැබිය යුතු රු:10000ක් වෙනුවෙන් ලද මුදල රු:8000 යි දුන් වට්ටම රු2000යි.
- 7/31 යාබද කාමරය රු:500000කට විකිණීමට ඇති බැවින් කාන්ති එය මිලදී ගැනීමට අදහස් කරයි.

ඉහත තොරතුරු ඇසුරින්

◆ . ඉහත ගනුදෙනුවල බලපෑම **වත්කම්= හිමිකම්+වගකීම්** යන සමීකරණයේ වටිනාකම සහිතව දක්වන්න.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

✓ පිළිතුර

| දිනය | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 2017/7/1 | මුදල්+250000 | +250000 | |
| 2017/7/2 | මුදල්-50000<br>බඩුතොග+50000 | | |
| 2017/7/5 | බඩුතොග-15000<br>මුදල්+25000 | +10000<br>ලාභ | |
| 2017/7/10 | බඩුතොග + 30000 | | වෙළඳ ණයහිමි +30000 |
| 2017/7/12 | මුදල්-3000 | -3000<br>සේවක වැටුප් | |
| 2017/7/15 | මෝටර් රථ+ 200000 | | ටයිටන් සමාගම +200000 |
| 2017/7/20 | මුදල්-5000 | -5000<br>ගැනිලි | |
| 2017/7/21 | මුදල්-13500 | +1500<br>ලද වට්ටම් | වෙළඳ ණයහිමි -15000 |
| 2017/7/24 | බඩුතොග-15000<br>වෙළඳ ණයගැති+20000 | +5000<br>ලාභ | |
| 2017/7/25 | මුදල්+100000 | | බැංකු ණය +100 000 |
| 2017/7/28 | වෙළඳ ණයගැති-10000<br>මුදල්+8000 | -2000<br>දුන් වට්ටම් | |
| 2017/7/28 | ගණුදෙනුවක් සිදුවී නොමැත. එබැවින් වාර්තා නොකරයි. | | |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

◆ ඉහත කාන්තිගේ ව්‍යාපාරයේ 2017 ජූලි මාසයේ ගනුදෙනු ආශ්‍රයෙන් ජූලි 31න් අවසන් මාසය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කරන්න

✓ පිළිතුර

කාන්තිගේ ව්‍යාපාරය

2017/07/31 දිනෙන් අවසන් මාසය සඳහා

ලාභ හෝ අලාභ ප්‍රකාශනය (රු.)

| | | |
|---|---|---|
| **විකුණුම්** | | |
| අත්පිට | 25000 | |
| ණයට | 20000 | |
| | | 45000 |
| | | |
| විකුණුම් පිරිවැය | | (30000) |
| | | |
| දළ ලාභය | | 15000 |
| | | |
| **වෙනත් ආදායම්** | | |
| ලද වට්ටම් | 1500 | 1500 |
| | | |
| | | 16500 |
| **වියදම්** | | |
| | | |
| සේවක වේතන | 3000 | |
| දුන් වට්ටම් | 2000 | 5000 |
| | | |
| ශුද්ධ ලාභය | | 11500 |
| | | |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

### 2.3.4. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම

- ඉහත කාන්තිගේ ව්‍යාපාරයේ 2017 ජූලි 31 දිනයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න

✓ පිළිතුර

කාන්තිගේ ව්‍යාපාරය
2017 /07/31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| මෝටර්රථ | | 200000 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| ඉතිරි තොගය | 50000 | |
| වෙළඳ ණයගැතියෝ | 10000 | |
| මුදල් | 186500 | 246500 |
| **මුළු වත්කම්** | | 446500 |
| | | |
| **හිමිකම් හා වගකීම්** | | |
| ප්‍රාග්ධනය | 250000 | |
| ශුද්ධ ලාභය | 11500 | |
| | 261500 | |
| ගැනිලි | (5000) | 256500 |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| ටයිටන් සමාගම | 75000 | |
| බැංකු ණය | 100000 | 175000 |
| | | |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | | 15000 |
| | | |
| මුළු හිමිකම් හා වගකීම් | | 446500 |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk